2009 අංක 01 දරණ

බස්නාහිර පළාත් සභාවේ

අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී (සංශෝධන) ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2009 ජනවාරි මස 20 වන දින පැවති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදී

සභා සම්මත වූ බව

සහතික කරමි.

දිනය : 2009/01/26

ජගත් අංගගේ,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

ජගත් අංගගේ
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

දිනය : 2009 . 01 . 28

එස්. අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

අනුමත කරමි / නොකරමි.

දිනය 2009.01.28

එස්. අලවි මව්ලානා
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

# බස්නාහිර පළාත

## 2009 අංක 01 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී සංශෝධන ප්‍රඥප්තිය

බස්නාහිර පළාතේ 2007 අංක 01 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2009 අංක 01 දරණ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී සංශෝධන ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර එය ආණ්ඩුකාර වරයා විසින් අනුමත කරන දිනයකදී ක්‍රියාත්මක වන්නේය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. 2007 අංක 01 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියේ 10(3) උප වගන්තියට ඉක්බිතිව 10(4) වශයෙන් පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10(4) මෙම අරමුදලට පළාත් පාලන ආයතන මගින් ස්ථානීය දඩ, සේවා ගාස්තු ලෙස බැරවන මුදලින් 50%ක ප්‍රතිශතයක් එකී පළාත් පාලන ආයතනයන්ට ඔවුන්ගේ පරිපාලන සීමාව තුළ නිශ්චිත කසළ කළමනාකරණ ව්‍යාපෘතියක් සඳහා යොදාගතහැකි අතර ඉතිරි මුදලින් 40% ක ප්‍රතිශතයක් එම පළාත් පාලන ආයතනය අදාළ අපද්‍රව්‍ය කළමනාකරණ කලාපයේ ක්‍රියාත්මක වන හඳුනාගත් පොදු ව්‍යාපෘතියක් සඳහා යෙදවිය හැකිය.

2. ප්‍රඥප්තියේ 2007 අංක 01 දරණ බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තියේ 15(1) වගන්තිය පහත සඳහන් ලෙස සංශෝධනය කරනු ලැබේ.

15(1)- අපද්‍රව්‍ය පොදු හෝ පෞද්ගලික පාරක් මත, ජලාශයකට, ඇලකට, දොළකට, ජල පහරකට, ඔයකට, ගඟකට, වැවකට, කලපුවකට හෝ මුහුදට යම් පොදු ස්ථානයක් මත දැමීම හෝ පෞද්ගලික ස්ථානයක් මත දැමීම වරදක් වන අතර එම වරද සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ වරදකරු කරනු ලැබූවිට 1 වන උපලේඛණයෙහි 2 වන තීරුවෙහි සඳහන් අපද්‍රව්‍ය ජනනය වන ප්‍රභවයෙහි ස්වභාවය අනුව, ඊට අනුරූපීව එම උපලේඛණයෙහි 3 වන තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොඅඩු 4 වන තීරුවේ සඳහන් ප්‍රමාණයන්ට නොවැඩි දඩයකට හෝ මාස 3කට නොඅඩු වසර එකකට නොවැඩි සිරගත කිරීමක් හෝ එකී දෙයාකාරයකින්ම හෝ දඬුවමකට යටත්විය යුතුය.

අනුමත කරමි / ~~නොකරමි~~

දිනය 2009.01.28

[illegible] මව්ලානා
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

A.